# මැතිවරණ පැමිණිලි 577ක්

## ප්‍රචණ්ඩ ක්‍රියාවල අඩුවීමක්

අනුරාධ හිරිපිටියගේ

මැතිවරණ නීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් පැමිණිලි 577 ක් ඊයේ (10 දා) දහවල් දොළහ වන විට පැෆරල් සංවිධානය වෙත ලැබී තිබේ.

මේවායෙන් අති බහුතරය නීති විරෝධී මැතිවරණ ප්‍රචාරක ක්‍රියා සම්බන්ධයෙන් යැයි පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා 'දිවයින'ට පැවසීය.

රාජ්‍ය දේපළ අවභාවිතය සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි මැතිවරණ කොමිසම වෙත යොමුකර ඇතැයි ද ඒ මහතා කීවේය. පෙර මැතිවරණවලට වඩා මෙවර මහ මැතිවරණයේ ප්‍රචණ්ඩ ක්‍රියාවල සැලකිය යුතු අඩු වීමක් දක්නට ඇතැයි ද හෙට්ටිආරච්චි මහතා පැවසීය.

ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් තහවුරු වූ පැමිණිලි 15 ක් පැෆරල් සංවිධානය වෙත ලැබී ඇතැයි ද හෙට්ටිආරච්චි මහතා කීවේය. පක්ෂ කර්යාලවලට හානි කිරීම් 4 ක්, තර්ජනය කිරීම් 5ක්, වාහනවලට හානි කිරීමේ සිද්ධි එකක්, නිශ්චල දේපළවලට හානි කිරීමේ සිද්ධියක් සහ පහරදීමේ සිද්ධි හතරක් ද ඊට ඇතුළත් බව ඒ මහතා කීවේය. පහරදීමේ සිද්ධීන් වාර්තා වී ඇත්තේ පක්ෂ පක්ෂ අතර නොව එකම පක්ෂයේ අය අතර යැයිද රෝහණ හෙට්ටිආරච්චි මහතා කීවේය. ඒවා මනාප සිද්ධීන් මුල්කර ගෙන ඇති වූ ඒවා යැයි ද ඔහු සඳහන් කළේය.